**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2015**

**-----------------------------------------------------------**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2019 මාර්තු 08 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2019 දෙසැම්බර් 13 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2019 ඔක්තෝබර් 07 දින දීය.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු සැසඳුම් පත්‍රය හා මුදල් පොත අනුව මුදල් ශේෂය රු. 628,560 ක් වුවද ශේෂ පත්‍රයේ මුදල් ශේෂය ලෙස රු.593,251 ක් දක්වා තිබුණි. ඒ අනුව රු. 35,309 කින් මුදල් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරයට අනුව ගමන් වියදම් හා සංයුක්ත දීමනා සඳහා උපචිත වියදම රු. 4,550 ක් වුවද අවසන් ගිණුම්වල එය රු.7,963 ක් ලෙස දක්වා තිබීමෙන් රු.3,413 ක් උපචිත වියදම යටතේ වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජරය අනුව අනෙකුත් සේවා සඳහා වියදම රු.331,429 ක් වුවද අවසන් ගිණුම්වල පරිපාලන වියදම යටතේ එය රු.367,229 ක් ලෙස දක්වා තිබුණු අතර රු.35,800 ක් ගිණුම් වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරය අනුව ටෙන්ඩර් ගාස්තු රු. 84,000 ක් වුවද අවසන් ගිණුමේ අනෙකුත් ආදායම් යටතේ එම වටිනාකම රු.84,500 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2015 වර්ෂය සඳහා ලී බඩු උපකරණ ක්ෂය වීම රු.843,946 ක් වුවද එය අවසන් ගිණුම් වල රු.1,419,386 ක් ලෙස දක්වා තිබීමෙන් ක්ෂය රු.575,440 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2015 ජනවාරි 01 දිනට ලී බඩු උපකරණ ක්ෂය වෙන් කිරීමේ ගිණුම් ශේෂය රු.2,014,614 ක් විය යුතු වුවත් එය රු.1,845,755 ක් ලෙස දක්වා තිබුණි. පෙර වර්ෂ වලදී ක්ෂය රු.168,859 කින් අඩුවෙන් ගැලපීම් කර තිබීම ඊට හේතු වී තිබුණි.

(උ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2015 වර්ෂයේ ලී බඩු උපකරණ මිලදී ගැනීම් රු.1,571,509 ක් වුවද ලෙජරයේ ලී බඩු උපකරණ ගිණුමෙහි එය රු.1,533,674 ක් ලෙස දක්වා තිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2014 වර්ෂයේ ලීබඩු උපකරණ මිලදී ගැනීම් රු.2,283,401 ක් වුවද ලෙජරයේ ලී බඩු උපකරණ ගිණුමෙහි එම වටිනාකම රු.2,321,236 ක් ලෙස දක්වා තිබුණි.

(එ) ලෙජරයේ ලී බඩු උපකරණ ක්ෂය ගිණුම රු.1,321,109 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල ලී බඩු උපකරණ ක්ෂය ලෙස රු.1,419,386 ක් දක්වා තිබුණි.

(ඒ) ලී බඩු උපකරණ වල වාර්ෂික ක්ෂය වීම රු.477,163 ක් වැඩියෙන් දක්වා තිබීම නිසා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති රජයේ ප්‍රදාන කපාහැරීමද රු. 477,163 ක් වැඩියෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.613,396 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,527,892 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,141,288 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රදාන රු.4,691,928 කින් අඩුවීම රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය රු.1,317,790 කින් අඩුවීම ඉහත ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) අධිකාරියේ පසුගිය වර්ෂ 05 හි ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) 2011 වර්ෂය රු.507,711 , 2012 වර්ෂය රු. (2,050,079) , 2013 වර්ෂය රු. (521,069), 2014 වර්ෂය රු 3,527,892 ක් හා 2015 වර්ෂය සඳහා රු. (613,396 ) ක් විය. මෙම වටිනාකමට එක් එක් වර්ෂයේ දරන ලද වැටුප් පාරිශ්‍රමිකය හා ක්ෂය ප්‍රමාණය නැවත ගැලපූ විට සියළුම වර්ෂ වල ශුද්ධ අතිරික්තයක් නිරූපනය වූ අතර එය පිළිවෙලින් රු.10,415,540, රු.11,783,227, රු.13,823,867, රු.19,486,750 ක් හා රු.17,084,600 ක් විය.